**කොළඹදී පවත්වනු ලබන (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන)**

**බස්නාහිර පළාත්බද මහාධිකරණයේදීය.**

**මහාධිකරණ විනිසුරු ගාමිණී අමරසේකර මැතිතුමා ඉදිරිපිටදීය.**

වාර්තා කරන්නේ :- ජී.ජී.පතිරනගේ විසිනි.

සේලාන් බැන්ක් පීඑල්සී

පැමිණිලිකරු-

එදිරිව-

1.චන්ද්‍රාආනන්ද මාන්නප්පෙරුම

සහ තවත් අය.

විත්තිකරුවන්-

**නඩු අංකය:- 469-2010 එම්.ආර්.**

**දිනය:** 2013.02.01

## නි යෝ ග ය

මෙම නඩුවේ 2012.06.07 දිනැති සාක්ෂි මෙහෙයවන විට පැ.3 ලේඛනය ලකුණු කිරීමට විරෝධයක් මතු වන ලද අතර, එකී විරෝධය පැන නගින ලද්දේ ඊට මුද්දර ගාස්තු ගසා නොමැති බැවින්, එය අවේශ්‍ය කල නොහැකි බව කියමිනි. මේ සම්බන්ධයෙන් පාර්ශ්වයන් ලිඛිතව කරුණු

ඉදිරිපත් කිරීම මත මෙම නියෝගය නියමිතය. පැ.3 යනු පැමිණිල්ල සමග " B " ලෙස ලකුණු කල පැමිණිල්ලේදී පාර්ශ්වයන් අතර වන ගිවිසුම ලෙස එහි 6 වන ජේදයේදී දක්වා ඇති ලේඛණය වේ. පැ.3 මුල් ලේඛනය අධිකරණය හමුවට ඉදිරිපත් කර ඇති අතර, එහි අවසාන පිටුවේ රු.100/-ක මුද්දර ලෙස සඳහන් ස්ථානයේ මුද්දර ගසා නොමැති බව පෙනී යයි. එහි මුද්දර ගාස්තු ගෙවන ලද බවට කරුණු කීමක් පැමිණිල්ලෙන් නැත. ඒ අනුව සැලකිය යුතු වන්නේ මෙම ගිවිසුම මුද්දර ගාස්තු වලට යටත්ද නැද්ද යන්නයි.

1982 අංක 43 වන මුද්දර ගාස්තු පනතේ 2 (a) අනුව ශ්‍රී ලංකාව තුළ සැකසූ සාධන පත්‍රයකට මුද්දර ගාස්තු ගෙවිය යුතු අතර, එහි 5 වන වගන්තියෙන් මෙවැනි ලේඛණ බැහැර කර ඇති බවක් පෙනී නොයයි. 1990.11.06 වෙනි දින දරන අංක 94815 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ අවසානයට ඇති 27 අයිතමය අනුව ඊට පෙර සඳහන් කර නැති සහ බැහැර කර නැති ලේඛණයකට රු.100/-ක මුද්දර ගාස්තු ගෙවිය යුතු වේ. අදාල පැ.3 දරණ ලියවිල්ල 2006.11.27 වන දිනදී සකස් කරන ලද්දකි. 2002. අංක 11 දරණ මුදල් පනතේ 3 වන කොටස අනුව සහ එහි 15 සහ 16 වගන්ති අනුව 2002 මැයි 01 සිට 1982 අංක 43 පනත යටතේ ලේඛන සහ සාධන පත්‍ර මත මුද්දර ගාස්තු පැනවීම සහ අයකිරීම් නැවති ඇති බව පෙනී යයි. ඒ අනුව 2002 මැයි 01 සිට පැ.3 වෙනි ලේඛණ වලට මුද්දර ගාස්තු අය කිරීමට 1982 අංක 43 පනතින් යෙදී තිබූ විධිවිධාන ක්‍රියාත්මක වීම අත්හිටුවන තත්වයක් ඇති වී ඇති බව පෙනී යයි. නමුත් 2006 අංක 12 වන

මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත පැනවී ඇති අතර, එකී පනත 2006 අප්‍රේල් 01 වනදා සිට ක්‍රියාත්මක වී ඇත. ඒ අනුව එකී පනත ක්‍රියාත්මක වීම පැ.3 දරණ ගිවිසුමට එළඹුනු දිනට ප්‍රථමව සිදු වී ඇත. ඒ අනුව දැන් සැලකිය යුතු වන්නේ එකී පනත තුලින් නැවත පැ.3 වැනි ලේඛන සම්බන්ධයෙන් මුද්දර ගාස්තු ගෙවීමක් ඇති කලේද යන්නයි. එහි 3 වන වගන්තිය අනුව එකී පනත ක්‍රියාත්මක වන දිනයේ සිට අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පලකරන ලද නියමයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ප්‍රමාණ අනුව එකී වගන්තියේ අ, ආ, අනු වගන්ති වල දැක්වෙන විශේෂිත සාධන පත්‍රයක් මත මුද්දර ගාස්තු අය කල හැකි බව පෙන්නුම් කරයි.

එකී විශේෂිත සාධන පත්‍ර එකී පනතේ 4 වන වගන්තියේදී දක්වා ඇත. එකී විශේෂිත සාධන පත්‍ර තුලට මෙම පැ.3 වැනි ගිවිසුමක් සාධන පත්‍රයක් ඇතුල් වී ඇති බවක් පෙනී නොයයි. නමුත් එකී පනතේ 3 වන පරිච්ඡේදයේ 15 වන වගන්තියේදී ඉහත කී 2002 අංක 11 දරණ මුදල් පනතේ 3 වන කොටසේ 15, සිට 18 දක්වා වගන්ති ඉවත් කර ඇත. ඒ තුලින් එකී 2006 අංක 12 දරන මුද්දර ගාස්තු විශේෂ විධිවිධාන පනත ක්‍රියාත්මක වන දින සිට නැවත 1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනතේ විධිවිධාන ක්‍රියාත්මක භාවයට පැමිණීම සිදු වේ. ඒ අනුව 1982 අංක 43 දරන මුද්දර ගාස්තු අයකල යුතු ලේඛණ සම්බන්ධයෙන්ද මුද්දර ගාස්තු ගෙවිය යුතු නීතිමය තත්වයක් මතු වේ. කෙසේ වෙතත්, 2006 අංක 12 මුද්දර ගාස්තු විශේෂ විධිවිධාන පනතත් 1982 අංක 43 දරණ මුද්දර

ගාස්තු පනතත් අතර ගැටුම් ඇති වුවහොත් එය නිරාකරණය සඳහා 2006 අංක 12 දරණ මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය පැනවී ඇති බව පෙනේ. එකී 13 වන වගන්තිය පහත උපුටා දැක්වේ.

13. " මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට සහ ඉන්පසු නිශ්චල දේපල පැවරීමට, මෝටර් වාහන පැවරීමට හෝ අධිකරණයේ ගොනු කරන ලිපි ලේඛන වලට අදාල සාධන පත්‍ර හැර මුද්දර ගාස්තු පැනවීම, නිදහස් කිරීම් සහ වෙනත් විධිවිධාන මේ පනතේ විධිවිධාන වලට අනනුකුල වනතාක් දුරට මුද්දර ගාස්තු පැනවීම, නිදහස් කිරීම සහ වෙනත් යම් විධිවිධාන වලට අදාලව 1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනතේ විධිවිධාන ක්‍රියාත්මක නොවිය යුතු අතර, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතුය. "

ඒ අනුව 2006 අංක 12 පනතේ විධිවිධාන හා ගැටෙනතාක් දුරට නැතහොත් අනනුකුල වනතාක් දුරට 1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනතේ විධිවිධාන ක්‍රියාත්මක නොවනු ඇත. 2006 අංක 12 දරණ මුද්දර විශේෂ විධිවිධාන පනතේ 3 හා 4 වගන්ති අනුව විශේෂිත සාධාන පත්‍ර මත මුද්දර ගාස්තු අය කිරීමට හැකි බවක් ඇති කර ඇත. එසේ වූ පමණින් දැන් නැවත ජීවය ලබන 1982 අංක 43 පනතේ 02 වගන්තියෙන් මුද්දර ගාස්තු ගෙවිය යුතු බව දක්වන ලේඛන මත මුද්දර ගාස්තු අය කිරීම හෝ එකී 1982 අංක 43 පනතේ 5වන වගන්තියෙන් දැක්වෙන නිදහස් කිරීම් වලට මුද්දර ගාස්තු අය නොකිරීම එනයින්ම නොකර සිටීම පැන නගින්නේ නැත.

යම් හෙයකින් 1983 අංක 43, පනතේ 2 වන වගන්තිය යටතේ මුද්දර ගාස්තු අයකල යුතු ලේඛණයක් ලෙස දක්වා ඇති ලේඛනයන් 2006 අංක 12 පනතේ 5 වන වගන්තිය යටතේ මුදා හරින ලේඛණයක් බවට පත් වුවහොත් අනනුකූලතාවයක් ගැටීමක් ඇති වනු ඇත.එවන් විටක 2006 අංක 12 පනත ක්‍රියාත්මක වනු ඇත. එමෙන්ම 1983 අංක 43 පනතේ 5 වන වගන්තිය තුලින් මුදා හැරෙන ලේඛනයක් 2006 අංක 12 පනතේ 3, 4, වගන්ති තුලින් මුද්දර ගාස්තු ගෙවිය යුතු ලේඛණයක් බවට පත් වුවහොත් අනනුකූලතාවයක් ඇති වනු ඇත. එවිට 2006 අංක 12 පනතේ විධිවිධානය ක්‍රියාත්මක වනු ඇත. මෙම තත්ත්වය තුල 2006 අංක 12 පනතින් පැ.3 වෙනි සාධන පත්‍රයක් බැහැර කිරීමට කටයුතු කර නැතැයි පෙන්වා සිටින්නේ නොමැති නම්, පනත් දෙක අතර අනනුකූලතාවයක් මෙම ලේඛණය සම්බන්ධයෙන් මුද්දර ගාස්තු අයකිරීමට පෙනී නොයනු ඇත.

2006 අංක 12 පනතේ 3, සහ 4 වගන්ති අනුව මෙම ලේඛණය ඇතුලත් වී නැතිවුවා වුවද, එකී පනතේ 15 වගන්තියෙන් 1982 අංක 43 පනත යලි ජීවය ලබා ඇති හෙයින් හා 1982 අංක 43 පනතේ 2 වගන්තිය යටතේ මෙම පැ.3 වැනි ලේඛන වලට මුද්දර ගාස්තු නියම කර ඇති නිසා හා ඊට පටහැනි වන ලෙස 2006 අංක 12 පනත යටතේ පැ.3 වැනි සාධන පත්‍ර මුදා හැර ඇති බවට පෙනී නොයන නිසා, පැ.3ට මුද්දර ගාස්තු ගෙවිය යුතු වීම සම්බන්ධයෙන් 2006 අංක 12 පනතේ විධිවිධාන වලින් අනනුකූලතාවයක් ඇති නොවන බව තීරණය කරමි. ඒ අනුව පැ.3 මුද්දර

ගාස්තු වලට යටත් වන ලේඛණයක් බව තීරණය කරමි. (2006 අප්‍රේල් 03 දාතම අංක 1439/2 දරණ ගැසට් පත්‍රයෙන් 2006 අංක 12 මුද්දර ගාස්තු පනත යටතේ මුද්දර ගාස්තුවෙන් නිදහස් කරන ලද ලේඛන දක්වා ඇති අතර, ඒ තුල පැ.3වැනි සාධන පත්‍ර නිදහස් කිරීමක් නැති බවද නිරීක්ෂණය කල හැක. ) මේ අනුව පැ 3 මුද්දර ගාස්තුවට යටත් ලේඛණයක් බවට තීරණය කරන අතර, දැන් සැලකිය යුතු වන්නේ එයට මුද්දර ගාස්තු ගෙවීම සඳහා දැන් අවස්ථාව ලබාදිය හැකි ද යන්නයි.1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනතේ 33(1) වගන්තිය අනුව එවැනි ලේඛණ සාක්ෂි ලෙස ආවේශ්‍ය කළනොහැකි බව දැක්වේ. "**වික්‍රමසිංහ සහ තවත් අයෙක් "එදිරිව ද සුඩ්වින් මැරයින් ඇකඩමි ප්‍රයිවට් ලිමිටඩ් (2001) 2. SLR.** 284 හි සඳහන් නඩු තීරණය අනුව මෙම සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන ලේඛණයේ මුද්දර ගාස්තු ඌනතාවක් වූයේ නම් එය එසේ ලකුණු කිරීමට ඉල්ලා සිටීමට පෙර නිවැරදි කළයුතු බව පෙනේ. මෙහිදී උත්තරයේ සිට හා විසඳනා නගන අවස්ථාවේදී මුද්දර ගාස්තු සම්බන්ධයෙන් දෝෂයක් ඇති බවට විත්තිය විසින් කරුණු මතු කර ඇත. එවන් විටක එකී ඌනතාවය මුද්දර ගාස්තු පනතේ 33(1) වගන්තිය අනුව සපිරීමට කටයුතු නොකර ඇත. සාක්ෂි ලෙස මෙම ලේඛණ ඉදිරිපත් කිරීමට තැත් කරන අවස්ථාවේදී මෙම විරෝධය මතු වී ඇත. දැන් තවදුරටත් දින දිම විත්තිය අගතියට පත්කරන ආකාරයේ දින දිමක් වනු ඇත. මන්ද විත්තිය විසින් විරෝධය මතු කළ විට සාක්ෂි සඳහා එය ලකුනු කිරීමට ඉල්ලා සිටීමට පෙර එකී ඌනතාව සපිරීමට සොයා බලා කටයුතු

කළ යුතුව තිබූ බැවිනි. මේ අනුව විරෝධතාවය පිළිගනිමි. පෑ 3 ලේඛණය ආවේශ්‍ය කිරීම ප්‍රතික්ෂේප කරමි.

(ගාමිණී අමරසේකර)

මහාධිකරණ විනිසුරු,

කොළඹ.

2013.02.01